ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය I කොටස

අවසාන පරීක්ෂණය 2006

විෂයමාලාව සහ ඉගෙනුම ඇගැයීම - **ESP 1263**

කාලය - පැය තුනයි (03)

---

දිනය : 2006.03.10 වේලාව : ප.ව.01.00 සිට ප.ව.04.00 දක්වා

---

ප්‍රශ්න <u>තුනකට *(03)* පමණක්</u> පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. **i.** "විෂයමාලාවක් " යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 05)

**ii.** ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හෝ ද්විතීයික හෝ පාසල් විෂයමාලාව තෝරා ගෙන එම විෂයමාලාවේ ප්‍රධාන ලක්ෂණ ඉස්මතු කර දක්වන්න.
(ලකුණු 14)

**iii.** තෝරාගත් එම විෂයමාලාව සංවර්ධනය කිරීමේදී එයට බලපා තිබෙන දාර්ශනික මනෝවිද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක අදහස් පැහැදිලි කරන්න.
(ලකුණු 14)

02. **i.** විෂයමාලා සංවර්ධන ආකෘති තුනක් නම් කර එම එක් එක් ආකෘතියෙහි ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.
(ලකුණු 15)

**ii.** ඔබ ආයතනයෙහි ගුරු අධ්‍යාපන විෂයමාලාවට මෙම ආකෘතිවල ප්‍රධාන ලක්ෂණ කොතෙක්දුරට අඩංගු කර ගෙන තිබේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 18)

03. "විෂයමාලා සංවිධානය යන්නෙන් අදහස් කෙරෙන්නේ අධ්‍යාපන පද්ධතියක හෝ ආයතනයක හෝ විෂයමාලාවක අඩංගු වන මූලිකාංග ගලපා තිබෙන, අන්තර් සබඳතාව දක්වා තිබෙන සහ පෙළගස්වා තිබෙන ආකාරය දැක්වීමය. ඉගැන්වීමේ සැලසුම් සහ පිළිවෙලවල්ද ඉගෙනුම් ආධාරක ද උපකරණ සහ පිරියත ද ගුරු බලකායේ වෘත්තීමය නිපුණතාව සහ තක්සේරු කිරීමේ සහ විභාග පැවැත්වීමේ ආයතනවල අවශ්‍යතා ද වැනි සාමාන්‍ය සාධක මෙම මූලිකාංගවලට අඩංගු වේ."
(ස්කිල්බෙක් - 1991)

**i.** යම් නිශ්චිත ඉලක්ක ජනගහනයක් සඳහා සංවර්ධනය කරන ලද විෂයමාලාවක් සංවිධානය කිරීමේදී විෂයමාලා සම්පාදකවරයකුට මුහුණ පෑමට සිදු විය හැකි ගැටළු ඉහත සඳහන ආශ්‍රයෙන් දක්වන්න.
(ලකුණු 08)

ii. ඉහත ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විෂයමාලා සම්පාදකවරයාට ඔබ උපදෙස් ලබා දෙන්නේ කෙසේ ද?
(ලකුණු 08)

iii. ඔබේ උපදෙස් පදනම් කොට ගෙන විෂයමාලාවක් සංවිධානය කිරීමේදී සලකා බැලීමට උචිත වන මූලධර්ම පහක් ලැයිස්තු ගත කර පැහැදිලි කරන්න.
(ලකුණු 17)

04. i. ශ්‍රී ලංකාවේ මෑත වසරවල දී වෙනස් කිරීමට භාජනය වූ ගුරු අධ්‍යාපන විෂයමාලාවක් හෝ පාසල් අධ්‍යාපන විෂයමාලාවක් හෝ හඳුන්වා, එහි ඇති කරන ලද ප්‍රධාන වෙනස්කම් ඉස්මතු කර දක්වන්න.
(ලකුණු 12)

ii. මෙම වෙනස් කිරීමට මුල් වූ තත්වයන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ඉහත විෂයමාලාව වෙනස් කිරීමේදී අනුගමනය කරනු ලැබූ පිළිවෙත් පැහැදිලි කරන්න.
(ලකුණු 13)

05. i. "ගුරු අධ්‍යාපනය" සම්බන්ධ විෂයමාලා ඇගැයීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
(ලකුණු 06)

ii. විෂයමාලා ඇගැයීමේ ක්‍රියාවලියේ දී විභාග කරනු ලබන අංශ මොනවා ද?
(ලකුණු 06)

iii. විෂයමාලා ඇගැයීමේදී සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන උපකරණ සහ පිළිවෙත් විස්තර කරන්න.
(ලකුණු 15)

iv. ඉහත උපකරණ සහ පිළිවෙත් භාවිතා කිරීමේ දී ඔබ විසින් නිරීක්ෂණය කරන ලද අඩුපාඩු සඳහන් කරන්න.
(ලකුණු 06)

06. i. විද්‍යාව විෂයයට අදාළව හයවන ශ්‍රේණියේ ශිෂ්‍යයින් 40 දෙනෙකු සඳහා 10-100 දක්වා පරතර වෙනස්කම් සහිත ලකුණු සමූහයක් සකස් කරන්න.
(ලකුණු 05)

ii. මෙම පංතියේ ශිෂ්‍යයින්ගේ කාර්යය සාධනය විශ්ලේෂණය කරන ලෙස ඔබෙන් ඉල්ලා ඇත. මෙම ශිෂ්‍යයින්ගේ කාර්යය සාධනය විශ්ලේෂණය කිරීම සඳහා ඔබ විසින් භාවිතා කරනු ලබන සංඛ්‍යා විද්‍යාත්මක ශිල්පීය ක්‍රම කවරේදැයි හඳුන්වා ඒවා ඔබ භාවිතා කරන ආකාරය දක්වන්න.
(ලකුණු 28)

- හිමිකම් ඇවිරිණි. -